# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# විවෘත සහ දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

## විවෘත සහ දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම - 2026

### ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව
### Certificate Course in English

**පාඨමාලා කාලය :** මාස 06 කි. (ඔබගේ තේරීම පරිදි සති අන්ත - සෙනසුරාදා හෝ ඉරිදා )

**පාඨමාලා ගාස්තු :** රු. 15,000.00 (වාරික 02 කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 10,000.00)

** ලියාපදිංචි වීමට පැමිණීමේ දී පළමු වාරිකය රු. 10,000.00 ක මුදල සහ අයදුම්පත්‍ර ගාස්තුව වන රු. 1000.00 රැගෙන ඒම අත්‍යාවශ්‍ය වේ

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම හෝ අයදුම්පත්‍ර බාරගන්නා දිනයට වයස අවුරුදු 16 සම්පූර්ණ වී තිබීම.

පාඨමාලාවට අදාළ දේශන හා විභාග විශ්වවිද්‍යාලයේ බෙලිහුල්ඔය පරිශ්‍රයේ දී පමණක් පැවැත්වේ.

(මෙම පාඨමාලාව සාර්ථකව නිමකරන සිසුන්ට ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අවස්ථාවක් ඇත.)

### ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව - සති අන්ත
### Diploma in English (DE) – Weekends

**පාඨමාලා කාලය :** වසර 01 කි (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු 30,000

(වාරික 02 කින් ගෙවිය හැකිය. පළමු වාරිකය රු 20,000)

**දේශන පැවැත්වීම -** මාර්ග ගත ක්‍රමය/ පැමිණ සහභාගීවීම

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ.පො.ස. සාමන්‍යය පෙළ ඉංග්‍රීසි විෂය සඳහා “A” හෝ “B” සමාර්ථයක් ලබා තිබීම හෝ ඉංග්‍රීසි සාහිත්‍ය විෂය සඳහා “C” සාමාර්ථයක් **හෝ** ඊට වැඩි සාමාර්ථයක් ලබා තීබීම **හෝ** අ.පො. ස. (උ.පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා “S” සාමාර්ථයක් ලබා තිබිම **හෝ** අප ඒකකය මඟින් පවත්වනු ලබන ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සමත් වී තිබීම.

*මෙම පාඨමාලාව සර්ථකව නිමකරන සිසුන්හට ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව හැදෑරීමට අවස්ථාවක් ඇත.

### ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව - සතියේ දිනයන්හි
### Diploma in English (DE) – Weekdays

**පාඨමාලා කාලය :** මාස 06 කි (සතියේ දින 2 ක දී)

**පාඨමාලා ගාස්තු :** රු 30,000

(වාරික 02 කින් ගෙවිය හැකිය. පළමු වාරිකය රු 20,000)

**දේශන පැවැත්වීම -** මාර්ග ගත ක්‍රමය/ පැමිණ සහභාගීවීම

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස. සාමන්‍යය පෙළ ඉංග්‍රීසි විෂය සඳහා “A” හෝ “B” සමාර්ථයක් ලබා තිබීම හෝ ඉංග්‍රීසි සාහිත්‍ය විෂය සඳහා “C” සාමාර්ථයක් **හෝ** ඊට වැඩි සාමාර්ථයක් ලබා තීබීම **හෝ** අ.පො. ස. (උ.පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා “S” සාමාර්ථයක් ලබා තිබිම **හෝ** අප ඒකකය මඟින් පවත්වනු ලබන ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සමත් වී තිබීම.

(මෙම පාඨමාලාව උසස් අධ්‍යාපන කටයුතු සහ වෘත්තීය කටයුතු සඳහා කඩිනමින් භාෂා කුසලතා දියුණු කර ගතයුතු අයට වඩා යෝග්‍ය වේ.)

*මෙම පාඨමාලාව සර්ථකව නිමකරන සිසුන්හට ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව හැදෑරීමට අවස්ථාවක් ඇත.

## ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව හා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා විශේෂ කොන්දේසි

මෙම ඉංග්‍රීසි පාඨමාලාවන් සඳහා අයදුම්පත් නිකුත් කිරීම හා බඳවා ගැනීම ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේහි දී පමණක් **2026.09.07** දින සිට **2026.10.06** දින දක්වා **ලියාපදිංචි වීමේ ප්‍රමුඛතාවය මත සිදු කෙරේ**. තව ද සීමිත සිසුන් සංඛ්‍යාවක් බඳවා ගන්නා බැවින් නියමිත සිසුන් සංඛ්‍යාව සම්පූර්ණ වූ පසු 2026.10.06 දිනයට පෙර වුව ද ලියාපදිංචි කිරීම අවසන් විය හැකි ය. එබැවින් මෙම පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලි හා මුදල් රැගෙන **2026.09.07** වන දින සිට **2026.10.06** අතර කාලය තුළ **සතියේ දිනවල පමණක් (සෙනසුරාදා, ඉරිදා, රජයේ නිවාඩු දින හා විශ්වවිද්‍යාල නිවාඩු දිනයන් හැර )** පෙ.ව 9.00 ත් ප.ව 3.00 ත් අතර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය වෙත තමාම පැමිණ ලියාපදිංචි විය යුතුය.

**රැගෙන ආයුතු ලියකියවිලි (මුල් පිටපත හා ඡායා පිටපතක් අවශ්‍ය වේ)**

1. උප්පැන්න සහතිකය
2. හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාවන්ට අදාළව සම්පූර්ණ කළ සුදුසුකම් සපුරා ඇති අධ්‍යාපන සහතික අනිවාර්ය වේ. (ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා අ.පො.ස. (සා.පෙළ) හෝ අ.පො.ස. (උ.පෙළ) හෝ ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවේ (CCE) සහතික රැගෙන ආ යුතුයි.)
3. ජාතික හැඳුනුම්පත
4. පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02 ක්
5. අයදුම්පත් ගාස්තුව රු.1,000.00
6. පාඨමාලා ගාස්තු (ඉහත සඳහන් පරිදි)

### ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා පාඨමාලාව
### Higher Diploma in English (HDE)

**පාඨමාලා කාලය :** වසර 01 කි (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 35,000.00 (වාරික 02 කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 25,000.00)

**පාඨමාලා මාධ්‍යය :** ඉංග්‍රීසි

**දේශන පැවැත්වීම:** මාර්ගගත (Online) / විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
විවෘත හා දුරස්ථ අධ්‍යාන කේන්ද්‍රය මගින් පවත්වනු ලබන ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර තිබීම

**හෝ**

සමාජීයවිද්‍යා හා භාෂා පීඨ අධ්‍යයන මණ්ඩලයේ අනුමැතියට යටත්ව වෙනත් පිළිගත හැකි ආයතනයක් මගින් NVQ LEVEL 5 (SLQF 3) සමාන ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවක් (Credit 30) සම්පූර්ණ කර තිබීම.

### මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව
### Diploma in Software Engineering (DSE)

**පාඨමාලා කාලය :** වසර 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 43,000.00
(වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 27,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල/ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

i. අ.පො.ස (උසස් පෙළ) සමත් වීම හෝ ඊට සමාන පිළිගත් සුදුසුකමක් ලබා තිබීම.
ii. විශ්වවිද්‍යාල සනාතන සභාව මගින් පිළිගනු ලබන SLQF මට්ටම 2 හෝ NVQF මට්ටම 4 ට සමාන තොරතුරු තාක්ෂණ පදනම් පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

### රත්නවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
### Diploma in Gemmology (DG)

**පාඨමාලා කාලය :** වසර 01 කි (සති අන්ත - සෙනසුරාදා සහ ඉරිදා)

**පාඨමාලා ගාස්තු :** රු. 90,000.00

(වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 60,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල/ ඉංග්‍රීසි

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :** අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම ක්ෂේත්‍රයකින් සමත් වීම හෝ ව්‍යවහාරික විද්‍යා පීඨ අධ්‍යයන මණ්ඩලයේ අනුමැතියට යටත්ව වෙනත් පිළිගත හැකි අධ්‍යාපන සුදුසුකම් හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වීම සමඟ අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් අවුරුදු 05 කට සමාන සහතික කළ සේවා පළපුරුද්දක් තිබීම.
දේශන විශ්වවිද්‍යාලයේ බෙලිහුල්ඔය පරිශ්‍රයේ දී හා වෛද්‍ය පීඨය - රත්නපුර දී පැවැත්වේ.

## ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Business Management (DBM)

**පාඨමාලා කාලය :** වසර 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 60,000.00
(වාරික 02 කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 40,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් විෂයයන් තුනක් සමත් වීම

**හෝ**

අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත්වීම සමඟ පිළිගත් ව්‍යාපාර ආයතනයක අවම වශයෙන් වසර 02ක පළපුරුද්ද ලබා තිබීම / ව්‍යවසායකයකු වශයෙන් වසර 02 ක ව්‍යාපාර පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

AAT,ACA,CIMA,CMA වැනි වෘත්තීය පාඨමාලාවක පළමු අදියර අවසන් කර තිබීම

**හෝ**

ශ්‍රී ලංකාව තුල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක ඕනෑම විෂය ක්ෂේත්‍රයක ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම (SLQF 03) හෝ ඊට සමාන NVQ පාඨමාලාවක් (NVQ 05) සම්පූර්ණ කර තිබීම

**හෝ**

අදාළ ක්ෂේත්‍රයක (ව්‍යාපාර කළමනාකරණ/මානව සම්පත් කළමනාකරණ/හෝ වෙනත්) පිළිගත් උසස් සහතිකපත්‍ර පාඨමාලාවක් (SLQF 02) හෝ ඊට සමාන NVQ පාඨමාලාවක් (NVQ 04) සම්පූර්ණ කර තිබීම හා අවම වශයෙන් වසර 02 ක සේවා පළපුරුද්දක් තිබීම

**හෝ**

විශ්වවිද්‍යාල සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් ඕනෑම සුදුසුකමක් සපුරා තිබීම.

## පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Pre School Teachers Training (DPSTT)

**පාඨමාලා කාලය :** අවුරුදු 01 කි. (සති අන්ත)
සෙනසුරාදා සහ ඉරිදා

**පාඨමාලා ගාස්තුව :** රු. 45,000.00

(වාරික 02 කින් ගෙවිය හැකි ය.
පළමු වාරිකය රු. 30,000/ දෙවන වාරිකය රු. 15,000.00)

**පාඨමාලා මාධ්‍ය :** සිංහල

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ.පො.ස. උසස් පෙළ සමත් වීම **හෝ** අ.පො.ස. සා/පෙළ (සිංහල භාෂාව සහ ගණිතය ඇතුළත්ව ) විෂයයන් 06 ක් සමත් වීම **සමග** රජයේ ලියාපදිංචි පෙරපාසලක/ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක සහායක වශයෙන් අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද **හෝ** අවමය වසර 12 ක පාසල් අධ්‍යාපනයෙන් පසු SLQF මට්ටම 2 ට සමාන පදනම් පාඨමාලාවක් සමත් වීම **සමග** රජයේ ලියාපදිංචි පෙර පාසලක/ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක සහායක වශයෙන් අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද **හෝ** NVQF මට්ටම 4 පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම **සමග** රජයේ ලියාපදිංචි පෙර පාසලක/ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක සහායක වශයෙන් අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දත් තිබීම.

## මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව
## Diploma in Financial Management (DFM)

**පාඨමාලා කාලය :** වසර 01 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 45,000.00

(වාරික 02 කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 30,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**

අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම ක්ෂේත්‍රයකින් සමත් වීම **හෝ**

රජයේ හෝ පිළිගත් පෞද්ගලික අධ්‍යාපන ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකමෙහි 4 වන අදියරට (NVQ Level 4) සමාන පාඨමාලාවක් අවසන් කර තිබීම **හෝ**

CA/ CIMA/ ACCA/ CIM/ HNDA වැනි පාඨමාලාවක් අර්ධ වශයෙන් අවසන් කර තිබීම **හෝ**

AAT (ශ්‍රී ලංකා)/ AAT (එක්සත් රාජධානිය)/ ICSA (එක්සත් රාජධානිය)/ IBSL/ IFA (එක්සත් රාජධානිය) අවසන් කර තිබීම **හෝ**

පිළිගත් මූල්‍ය ආයතනයක අවම වශයෙන් වසර 02 පළපුරුද්දක් තිබීම.

### තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
## Certificate in Information Technology (CIT)

**පාඨමාලා කාලය :** මාස 06 කි. (සති අන්ත)

**පාඨමාලා ගාස්තු :** රු. 25,000 (වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 15,000.00)

**පාඨමාලා මාධ්‍යය :** සිංහල / ඉංග්‍රීසි
**දේශන පැවැත්වීම:** මාර්ගගත (Online) / විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී

**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
කනිෂ්ඨ ද්විතියික අධ්‍යාපන මට්ටම, එනම් **9 ශ්‍රේණිය හෝ ඊට සමාන මට්ටමක්** සාර්ථකව සම්පූර්ණ කර තිබීම **හෝ කිසියම් ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර දෙකක සහතික කළ සේවා පළපුරුද්දක් තිබීම හෝ** විශ්වවිද්‍යාල සනාථන සභාව විසින් අනුමත කරන ලද ඊට සමාන අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකමක් සපුරා තිබිය යුතු අතර අයදුම්කරු **වයස අවුරුදු 16ක් හෝ** ඊට වැඩි විය යුතුය.

### තොරතුරු තාක්ෂණය පිළිබඳ වෘත්තීය පාඨමාලාවන් (IT Professional Courses)

පරිගණක ආශ්‍රිත උසස් සැලසුම් නිර්මාණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
**Certificate in Advanced Computer Aided Drawing (CAD)**

වෙබ් අඩවි පදනම් යෙදවුම් සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
**Certificate in Web Based Application Developmet (WEB)**

ජාවා උසස් වැඩසටහන්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
**Certificate in Advanced Java Programming (JAVA)**

*Lectures will be conducted in hybrid mode

**පාඨමාලා කාලය :** මාස 06 කි. (සති අන්ත - CAD, JAVA පාඨමාලාවන් සෙනසුරාදා දිනයේ දී සහ WEB පාඨමාලාව ඉරිදා දින වශයෙනි)
**ඒක් පාඨමාලාවක් සඳහා ගාස්තු :** රු. 19,500.00 (වාරික 02කින් ගෙවිය හැකි ය. පළමු වාරිකය රු. 12,500.00)
**පාඨමාලා මාධ්‍යය :** සිංහල/ ඉංග්‍රීසි
**දේශන පැවැත්වීම:**
මාර්ගගත (Online) හා විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී
**පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :**
අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් සමත්වීම හෝ විශ්වවිද්‍යාලය මගින් අනුමත කරනු ලබන වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම.

මෙම එක් එක් පාඨමාලාවන්ට ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් **2026.09.07** වන දින සිට **2026.10.06** දක්වා පෙ.ව 9.00ත් ප.ව 3.00ත් අතර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ **විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය** වෙත පැමිණ රු.1,000.00 ක් ගෙවා (ආපසු නොගෙවන) ලබාගත හැකි ය. නැතහොත් **www.sab.ac.lk/codl** වෙබ් අඩවිය වෙත පිවිස අදාළ පාඨමාලාවේ අයදුම්පත හා බැංකු ගෙවීමේ රිසිට්පත බාගත කර ගත හැකි ය.තවද අයදුම්පත්‍ර ගාස්තුව වන රු. 1,000.00 ක මුදලක් (ආපසු නොගෙවන) ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ ගිණුම් අංක **"0002246875"** ට අයදුම්කරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ පාඨමාලාවේ නම නිවැරදි ව දක්වමින් බැර කළ යුතුය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත, බැංකු ගෙවීම් රිසිට්පත හා පහත සඳහන් ලේඛනයන්හි **සහතික කළ පිටපත්** සමඟ **අධ්‍යක්ෂ,විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ. පෙ.02, බෙලිහුල්ඔය** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය.

1. උප්පැන්න සහතිකය
2. සුදුසුකම් සනාථ කිරීමේ සහතිකය /ලිපියක් (අධ්‍යාපන හෝ වෙනත්)
3. ජාතික හැඳුනුම්පත

**එක් අයදුම්පතක් වලංගු වන්නේ එක් පාඨමාලාවකට අයදුම් කිරීම සඳහා පමණි. අසම්පූර්ණ හෝ වැරදි තොරතුරු අතුළත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි ය.ඉහත සඳහන් සියලු ම පාඨමාලාවලට අදාළ දේශන හා විභාග පැවැත්වීම ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ බෙලිහුල්ඔය පරිශ්‍රයෙහි දී සහ මාර්ගගත ක්‍රමයට (Online) පමණක් සිදු කෙරේ.**
**වැඩි විස්තර සඳහා විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ දුරකථන අංක 045-2280179 අමතන්න.**

***සැලකිය යුතුයි:***

**අනෙකුත් පාඨමාලාවන් සඳහා විශේෂ කොන්දේසි:** අදාළ පාඨමාලා ආරම්භ කිරීම සඳහා සම්පූර්ණ වියයුතු අවම සිසුන් සංඛ්‍යාව ලියාපදිංචි වී නොමැති නම්, ඒම පාඨමාලා ආරම්භ කිරීම සිදුනොවීමට ඉඩඇත.

ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
**2026.09.06**

වැඩි විස්තර : විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
දුරකථන අංක: **045-2280179**